37 වන පිටෙන්

රූපයකි. ඒ දෙකේ ප්‍රත්‍යයද දෙකකි.) එසේ ගෙන ඇස ඉදිරිපිටට පැමිණි ස්කන්ධ රූපය සහ සිතේ ගොඩනඟා ගත් උපාදානස්ඛන්ධරූපය දෙක එකට ගැට ගසා ගැනීම සිදුවන තාක් අපේ ලෝකය තුළ උපාදාන රූප ලෙස 'අම්මා', 'තාත්තා', සිටී. අම්මා තාත්තා මිය යාම යනු ආහාරයෙන් සැදී ඒ ඒ ස්ඛන්ධ රූපයන්ගේ නිරුද්ධවීමකි. අම්මා තාත්තා යන ස්කන්ධ රූප පැවැත්මට යමක් ප්‍රත්‍යවීද, ඒ ප්‍රත්‍යයන් නිරුද්ධ වීමෙන් අම්මා තාත්තා යන ස්කන්ධ රූපද නිරුද්ධ වේ. එහෙත් අම්මා තාත්තා මිය ගිය පසුවද අම්මා තාත්තා ලෙස ගොඩනඟා ගත් උපාදානස්කන්ධ රූප සිත තුළ එසේම පවතී. (ඊට හේතුවන්නේ උපාදානස්ඛන්ධ රූපයට ප්‍රත්‍යවන්නේ අප තුළ පවත්නා තණ්හාව වීමත් තණ්හාව පවතින තාක් උපාදානස්ඛන්ධ රූපය නිරුද්ධ නොවීමත්ය. බාහිර ලෝකයේ ස්කන්ධ රූපයේ ආහාර ප්‍රත්‍ය නිරුද්ධ වන විට අපගේ අභ්‍යන්තර ලෝකයේ ගොඩනැඟී ඇති උපාදාන රූපයට ප්‍රත්‍ය වන තණ්හාව නිරුද්ධ වන්නේ නැත.) එනිසා අවශ්‍යනම් ඇති තාක් කල් ඒ උපාදාන රූප ඇසුරු කරමින් 'අනේ අපේ අම්මා' යැයි සිත සිතා දුක් විඳීමේ හැකියාවද අපට එසේම පවතී.

ජීවත්ව සිටින අම්මා ගැන සිතා සතුටුවීමේ හෝ දුක්වීමේ හැකියාව අපේ මනස තුළ අඩු නැතිවම පවතින්නාක් සේම මැරුණු අම්මා ගැන සිතා සතුටුවීමේ හෝ දුක්වීමේ හැකියාවද අපේ මනස තුළ අඩු නැතිවම තිබේ. මැරුණු අම්මා සිහිකර අඬන්නට ඔබට පුළුවන්කම තිබේ. එහෙත් අම්මා යනුවෙන් ඔබ හඳුනාගෙන සිටි යම්තාක් රූප වේද ඒ සියල්ල ඒ වන විට නිරුද්ධ වී අවසන්ය. එසේ තිබියදීත් මැරුණු අම්මා ඔබට රූපයක් ආකාරයෙන් දැකිය හැකිය. ඔබ ඒ දකින්නේ අම්මාගේ සැබෑ ස්කන්ධ රූපය නොව එය ප්‍රත්‍යය කොටගෙන සිතේ ඇතිකරගත් රූප උපාදානස්ඛන්ධයයි. අම්මා මිය ගිය පසුවද ඔබට අම්මාගේ රූපය දැකිය හැකිව ඇත්තේ යම් සේද, ඒ ආකාරයෙන් අද ඔබට සිතෙන් දකින්නට හැකි අනෙකුත් සෑම අතීත රූපයක්ම රූප උපාදානස්ඛන්ධයකි. ඒ සියල්ලම මේ වන නිරුද්ධ වී අවසන්ය.

පංච උපාදානස්ඛන්ධ ලෝකය යනු තියනවාඉන්නවා යනුවෙන් අපිට සිහිකළ හැකි සියල්ලයි. ඊට අයත් වන්නේ සත්ත්වය න් පුද්ගලයන් පමණක් නොවේ. ගම් නගර ගංගා මුහුද ආදී ඇස් ඉදිරිපිටට එන ඕනෑම අරමුණක රූපය ඒ මොහොතේම නිරුද්ධ වේ. එහෙත් ඒ රූපය ඇති බවට මනස තුළ රූපයක් ඉතිරිවේ. ජීවිත කාලය පුරා අපි වරෙක ඇලෙමින්ද, වරෙක ගැටෙමින්ද කටයුතු කරන්නේ මේ ආකාරයෙන් ගොඩනැඟුණු උපාදානස්ඛන්ධ සමඟය.

සිතට සිහිවන මේ රූප නිමිති නොඇලී නොගැටී බැලිය හැකි ක්‍රම කිහිපයක් තිබේ. ප්‍රධාන ක්‍රම දෙකකි. සිතට සිහිවන රූපයේ නොඇලී නොගැටී සිටීමට අනුගමනය කළ හැකි එක් ක්‍රමය වන්නේ සැබෑවටම පෙනුනු රූපයේ (ස්කන්ධ රූපයේ) ඇත්ත පෙන්වා දීමය. යහළුවෙකු සිහිපත් වුණොත් එහිදී කිසිදු අඩුවකින් තොරවම සිහිපත් වන්නේ යහළුවාමය. ඒ නිමිත්ත බොරු කරගැනීමට තිබෙන්නේ ඇස් ඉදිරිපිටට ආව හෝ එන හමුවන (අතීතවර්තමානඅනාගත) රූපයේ ඇත්ත සිතට පෙන්වා දීමයි. එනම් ස්කන්ධ රූපයේ ඇත්ත (යථාභූත) ස්වාභාවය පෙන්වා දීමයි.

යාලුවෙකු සිහිවුණු විට අපි සිතන්නේ මේ වෙනදා දුටු යහළුවාම බවකි. අපි හිතන යහළුවාමයි දැක්කේ. දැකපු යහළුවා ගැනමයි සිතන්නේ කියා හිතන රූපය දැකපු එකටද, දැකපු රූපය හිතන එකටද ලෙසින් දෙක එකට ගැට ගසා සතර මහා ධාතූන් සමඟ මනසින් සම්බන්ධවීමෙන් අපි ලෝකය ගොඩනඟා ගෙන සිටිමු. ජරා මරණ දුක් ඇත්තේ අපි මේ ලෙසින් ගොඩනඟාගෙන ඇති පංචඋපාදානස්ඛන්ධ ලෝකය තුළය. යාලුවා ලෙඩ වෙච්ච දුක. යාලුවා මැරිච්ච දුක. යාලුවාට බැනපු දුක. යාලුවාට ගහපු දුක. ආදී ලෙස පංචඋපාදානස්ඛන්ධ දුකම ඇත්තේ මෙතනය.

මේ පංචඋපාදානස්ඛන්ධ දුක හටගත්තේ කෙසේද? ඇස් ඉදිරිපිටට ආ රූපයේ ඇත්ත නොදන්නාකම නිසා ඒ රූපය රසවිඳගැනීම් අනුව බලපු නිසා 'අවිජ්ජා', 'භව තණ්හා' යන කෙලෙස් ටිකයි පංචඋපාදානස්ඛන්ධ දුක හැදෙන්නට හේතු වන්නේ. ඇස් ඉදිරිපි ටට එන රූපයේ ඇත්ත ඇති සැටියෙන් හෝ දකී නම් පංචඋපාදානස්ඛන්ධ ලෝකය දියවී යයි. එනම් උපාදානයක් සේ දකින යහළුවා සිත තුළ ඇත්තක් නොවේ. එවිට දුක ඇතිවෙන තෙක් යාලුවා ගැන සිතන්නට සිදුවන්නේ නැත.

'දුක්ඛ නිරෝධගාමිණී පටිපදාව' යන සම්මා දිට්ඨිය හෙවත් ඇත්ත ඇති සැටියෙන් දැකීම යනු ඇස් ඉදිරිපිටට ආ රූපයේ අනාත්මය සිතට පෙන්වීමයි. එසේ නැතිනම් ප්‍රත්‍ය නිසා හටගත් ඒ රූපය ප්‍රත්‍ය නිරුද්ධවීමෙන් නිරුද්ධ වෙන බව දැකීමය. උපමාවකින් දක්වතොත් මෙසේය. කණ්ණාඩියකට එබෙන විට කණ්ණාඩිය තුළ අපේ රූපයේ ඡායාව වැටේ. අපේ රූපය සකස්වී ඇත්තේ ආහාර ප්‍රත්‍යයෙනි. එය ස්කන්ධ රූපයකි. අපි කණ්ණාඩිය අසළින් ඉවත්වන විටම කණ්ණාඩිය තුළ දිස්වූ අපේ ඡායාව ඉතිරි නැතිවම නැතිවේ. නමුත් කණ්ණාඩිය තුළින් දුටු රූපය අපිට සිතෙන් සිහිකළ හැකිය. රූප උපාදානස්ඛන්ධය යනු එලෙස සිහින් සිහිපත් කළ හැකි රූපයයි. එහෙත් මෙවැනි කාරණයක්ද තිබේ. දැකපු රූපය සිතෙන් සිහිකළ පමණකින් රූප උපාදානස්ඛන්ධය නොවේ. රහතන්වහන්සේ නමකටද දැකපු රූපයක් නැවත සිහිකළ හැකිය. දැකපු දේ දැන් නිරුද්ධ වී ඇති බවත් මේ සිහි කරන්නේ මනසින් පමණක්ම බවත් අවබෝධ නම් එය නිරුද්ධ වනවා මිස එය ඇත්තක් නොවේ. නමුත් කණ්ණාඩියේ තිබුණු රූපයයි මේ සිහිකරන්නේ කියා ඔබට දැකපු දේ නැවත සිහිපත් වෙනවා නම් දෝෂය ඇතිවන්නේ එතැනය.

නිවන් දැකීම සඳහා චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීමට විදර්ශනා කිරීම යනුවෙන් හැඳින්වෙන්නේ ස්කන්ධ රූප සහ උපාදානස්ඛන්ධ රූප වෙන්කොට දැකීමයි. එහිදී සිතට සිහිවන සෑම රූපයක්ම (හෙවත් මේ පංචඋපානස්ඛන්ධ ලෝකයම) ආහාර ප්‍රත්‍යයෙන් හටගත්ත ආයතන ලෙසින් නොරැවටිය යුතුය. මේ ටික වෙන්වන විදිහට පෙන්වීමට විදර්ශනා භාවනා කරනවා යැයි කියය.

විදර්ශණා භාවනා කිරීමට මුළු දවස පුරාම හෝ දීර්ඝ කාලයක් එකම ඉරියව්වකින් ඉඳගෙන සිටීමේ අවශ්‍යතාවක් නැත. එකම ඉරියව්වකින් ඉඳගෙන වේවා, හිටගෙන වේවා, ඔබමොබ ඇවිදිමින් වේවා, නිදාගෙන වේවා, මේ කවර ඉරියව්වකින් වුවත් විදර්ශණා භාවනා කළ හැකිය. නිදාගැනීමේ ඉරියව්ව ථිනමිද්ධයට බොහෝ හිතකර එකක් වන බැවින් එම ඉරියව්ව භාවිතා කිරීම අඩුකරගැනීම වඩා සුදුසුය. කවර ඉරියව්වක හෝ වේවා සිහිය පිහිටු වාගෙන සිත පිළිබඳ විමසිල්ලෙන් සිටිය යුතුය. එසේ සිටින විට ඔබට කෙනෙකු සිහි වුවහොත් එහි යථාභූත ස්වාභාවය මෙනෙහි කළ යුතුය. එනම් මෙසේ සිහිවන රූපය පෙර ඇහැට පෙණුනු රූපයක් අරඹයා ප්‍රමාදීව වාසය කිරීමෙන් හටගත් දෝෂයක් බව සිහිපත් කළ යුතුය. එසේ කළ විට එම රූපය ඇත්තක් ලෙස ගෙන, කෙනෙක් පුද්ගලයෙක් වශයෙන් ගෙන එහි ඇලෙන ගැටෙන තැන දක්වා දක්වා සිතිවිලි වැඩි දියුණුවීමක් සිදු නොවේ.

එසේ නොකර සිතෙන් සිහිපත් වන රූපයට සතර මහා ධාතුවේ නවාතැනක් දුනහොත් පංචඋපාදානස්ඛන්ධ ලෝකය ඇත්තක් බවට පත්වේ. යම් වෙලාවකදි මෙය අපේ දෝෂය නිසා කෙලෙස් නිසා ඇතිවුණු රූපයක් බව සිහිපත් කරගතහොත් එසේ පෙන්වන්න පෙන්වන්න ටිකෙන් ටික මනස තුළ තිබෙන සියලු ආකාරයේ සත්ත්ව පුද්ගල, ගෙවල් දොරවල් යාන වාහන ආදී තිබෙනවා යැයි දකින යථාභූ ස්වාභාවය අවබෝධ වේ. කර්ම භවය යනුවෙන් හැඳින්වෙන්නේද මේ ස්වාභාවයයි. ඇස් දෙක වසාගෙන විවිධ දේ අපට සිහිපත් කළ හැකිය. අපි එසේ බාහිර ඇතැයි සිහිපත් කරන්නේ අපේ මනසමය. නමුත් අපි දැකපු දේ සිහිකරන දේටද, සිහි කරන දේ දැකපු දේටද ගැටහන තාක් කල් මේ අපේ මනසම බව අපට අවබෝධ නොවේ.

එබැවින් බුදුහාමුදුරුවන්වහන්සේ මෙසේ පෙන්වා දී තිබේ. ඇස අනිත්‍යයයි. රූපය අනිත්‍යයයි., කණ අනිත්‍යයයි. ගන්ධය අනිත්‍යයයි., දිව අනිත්‍යයයි. රසය අනිත්‍යයයි., කය අනිත්‍යයයි. ස්පර්ශය අනිත්‍යයයි., මනස අනිත්‍යයි. ධර්මතා අනිත්‍යයයි., ආහාර ප්‍රත්‍යයෙන් හටගත් ස්කන්ධයන්හි ස්වාභාවය වන්නේ අනාත්මභාවයයි.

නිදසුනක් මෙසේය. රූපවාහිනි තිරයේ අපි දකින රූප යනු සත්ත්වයෙකු හෝ පුද්ගලයෙකු නොවේ. ජීවිත කාලය පුරාවටම ඇස් ඉදිරිපිටට පැමිණි සියලුම රූපද එසේමය. අනාත්මය. එහෙත් ඒ රූපයේ ඇත්ත නොදන්නාකමක් තිබුණොත්, එය රසවිඳගැනීමේ අරමුණින් බැලුවොත් ඒ රූපය ඒ විදිහටම අපගේ සිතේ රැඳේ. එයට රූප උපාදානස්ඛන්ධය යැයි කියයි. මේ ධර්මතාවය වේදනා, සංඥා, සංකාර, විඥ්ඥාණ වලටද ඒ ආකාරයෙන්ම අදාළ වේ. පොදු ධර්මතාවයකි. අම්මා තාත්තා අයියා අක්කා නංගි මල්ලී ආදී වශයෙන් අප සිතේ රැඳී ඇත්තේද එලෙසින්ම ගොඩනැඟුණු පංචඋපාදානස්ඛන්ධයන්ය. අපේ සිතේ සතුට හෝ අසතුට ඇතිවන්නේ කිසිම පුද්ගලභාවයක් නොමැති මේ ආකාරයන් ගොඩනැඟුණු උපාදාන රූප දෙස බලාගෙනය.

මනසේ ඇති රූප නිමිත්තට 'සාසවා උපාදානීයා' යැයි කියයි. 'ආශ්‍රවවලට හිතයිඋපාදානයට හිතයි' යන අදහසය. එනම් සත්ත්වයෙකු, පුද්ගලයෙකු ලෙස ගැනීමට එම නිමිත්ත හිතය. දිගින් දිගටම එන ආත්මයක් බව හිතන්නට මේ රූපය හිතය. හෝ රන් රිදී ආදී වශයෙන් වන කාම භාණ්ඩයක් හිතීමට මේ රූපය හිතය. මේ රූප නිමිත්තට හේතු වූ ඇස් ඉදිරිපිටට පැමිණි සැබෑ රූපයට රූපස්කන්ධය යැයි කියයි. එහි ස්වාභාවය අනාත්මය. ඒ රූපයේ ඇත්ත නොදන්නාකම නිසා හෝ රසවිඳගැනීම් අනුව බැලීමේ දෝෂය නිසා දුටු රූපය ඒ ආකාරයෙන්ම සිහිපත් කිරීමේ හැකියාව ඇතිවිය. අපි කටයුතු කරන්නේ, හැසිරෙන්නේ එලෙස හැදෙන උපාදාන ලෝකය සමඟිනි. එය සැදෙන්නේ ඇස කණ නාසය ආදී ආයතන ශුන්‍යයව තිබියදීය. හෙවත් අම්මා ඇස් ඉදිරිපිට නැති විට අම්මා දැකීමේ හැකියාවක් ඇතිවීමය. සං ගීතයක් කණ්වල නොගැටෙද්දී සංගීතයක් ඇසීමේ හැකියාව ඇතිවීමය. මේ ආකාරයෙන් යහලු මිත්‍රයන්, ගම් රටවල්, හමුවූ වෙන්වූ තැන්, රැකියාව කළ ස්ථාන ආදී වශයෙන් බොහෝ දේ අපට සිහිකළ හැකිය. අපේම ලෝකයක් සාදාගත හැකිය. ඒ සැම තැනකදීම සිතින් දකින්නේ රූපවාහිනී තිරයෙන් දකින්නාක් වැනි රූපයන්ය. ඒ සියලු රූප සිතෙන් අපට ඔසවා ගත හැකිය.

එහෙත් ආහාර ප්‍රත්‍යයෙන් හැදුණු ස්ඛන්ධ රූපය අපට එලෙස අපට සිතෙන් ඔසවා ගත නොහැකිය. අම්මාගේ ස්ඛන්ධ රූපය ඔසවා ගන්නට අපට නොහැකිය. එම ස්ඛන්ධ රූපය සංකත සහ අනිත්‍ය වූවක් බැවිනි. අම්මාගේ ස්කන්ධ රූපය පිළිබඳ ඇත්ත නොදන්නා කමින් බලා සිටියහොත් එම රූපය ඒ විදිහටම සිතෙන් ඔසවා ගැනීමට නම් හැකිය. එලෙස සිතෙන් ඔසවා ගන්නා රූපය හෙවත් උපාදනස්ඛන්ධ රූපය 'සාශවා උපාදානීයා' වේ. උපාදානයන්ට හිත, ආශ්‍රවයන්ට හිත රූපය යන අදහසය. දැන් ඒ රූපයත් සමඟ සත්වයෙක් පුද්ගලයෙක් හැටියට හැසිරීමටද අපට පුළුවන්කම ඇතිවේ.

දුක ඇත්තේ ඒ ආකාරයෙන් අපි ගොඩනඟා ගත්තා වූ අම්මා තාත්තා අයියා අක්කා යහළුවා ආදී වශයෙන් සිටින පංචඋපාදානස්ඛන්ධ ලෝකයකය. ඒ ලෝකය පිළිබඳව අප තුළ ඇති තණ්හාව නිසාය. මේ පංචඋපාදානස්ඛන්ධ ලෝකය කෙරෙහි සිතේ තණ්හාවක් ඇති නොවේ නම් දුක ඇති නොවේ. සිතට එන රූප අරමුණු පිළිබඳ අපි ආදරයක් සෙනෙහසක් ඇතිවන ආකාරයට නොසිතන්නේ නම්, තරහා ඇති වන ආකාරයට නොසිතන්නේ නම් දුක ඇති නොවේ. තණ්හාව නැති වූවිට දුක නැති වෙයි.

තණ්හාව නැති වන්නට නම් දකින රූපයේ ඇත්ත දැකිය යුතුය. හෙවත් එම රූපයේ යථා භූත ස්වාභාවය දැකිය යුතුය. ඒ රූපය හැදුණු ආකාරය දැකිය යුතුය. එය දැකීමට අපට නැවත මුලට යන්නට සිදුවේ. ඇස් ඉදිරිපිටට ආ රූපයේ ස්වාභාවය හඳුනාගත යුතුවේ.

ලබන කලාපයට...



ශ්‍රීලාල් සෙනෙවිරත්න

